**1990 අංක 07 දරණ බස්නාහිර පළාතේ පළාත් පාලන බල මණ්ඩලයේ (විශේෂ විධි විධාන) ප්‍රඥප්තිය.**

# THE WESTERN PROVINCE LOCAL AUTHORITIES (SPECIAL PROVISIONS) STATUTE NO; 07 OF 1990

1998 අංක 38 දරණ ප්‍රාදේශීය බල මණ්ඩල (විශේෂ විධි විධාන) පණතේ iv සහ i වන උපලේඛණ වල දැක්වෙන ප්‍රාදේශීය සභාවලට විශේෂ කොමසාරිස්වරුන් පත් කිරීම සඳහා සහ ඊට සම්බන්ධ සහ/හෝ ඊට අනුෂාංගික කරුණු සඳහන් විධි විධාන සැලැස්සවීම උදෙසා වන ප්‍රඥප්තියයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් සම්මත කරුණු පිණිසයි.

1. මෙම ප්‍රඥප්තිය 1990 අංක 07 දරණ බස්නාහිර පළාත් පාලන බල මණ්ඩල (විශේෂ විධි විධාන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි මාතෘකා නාමය

2. (1) වෙනත් යම් නීතියක මීට පටහැනිව කුමක් සඳහන් වුවද 1988 අංක 38 දරණ ප්‍රාදේශීය බල මණ්ඩලය (විශේෂ විධි විධාන) පණතේ iv හෝ v දරණ උපලේඛණවල දැක්වෙන යම් ප්‍රාදේශීය සභාවක කටයුතු පරිපාලනය කිරීම සඳහා ගැසට් පත්‍රයෙහි පළ කරණු ලබන නියෝගයක් මගින් විශේෂ කොමසාරිස්වරයෙකු පත් කිරීමට පළාත් පාලන විෂය පවරනු ලැබ සිටින පළතේ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාට හැකිය. විශේෂ කොමසාරිස්වරයා පත් කිරීම.

(2) ප්‍රාදේශීය සභාවක බල ප්‍රදේශය ඇතුල්වන ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා (1)වන උපවගන්තියේ සඳහන් විශේෂ කොමසාරිස්වරයා විය යුතුය.

(3) එම නියෝගයෙහි වෙනත් අන්දමකින් සඳහන් වුවහොක් මිස, මෙම ඡේදයෙහි (1)වන උප ඡේදයෙහි සඳහන් විශේෂ කොමසාරිස්වරයකු පත් කිරීම එම උප ඡේදයෙහි සඳහන් එම ප්‍රාදේශීය සභාව සඳහා ඡන්ද විමසීම් සිදුකෙරෙන තුරු බල පැවැත්විය යුතුය.

(4) මෙම ඡේදයෙහි (1)වන උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවකට පත් කරනු ලැබූ විශේෂ කොමසාරිස්වරයකු මිය යෑම, ඉල්ලා අස්වීම, තනතුරෙන් පහ කිරීම හෝ වෙනයම් ආකාරයකින් ප්‍රාදේශීය ලේකම් වශයෙන් වූ ඔහුගේ ස්ථිර තනතුර පුරප්පාඩු වුවහොත් ඔහුගේ අනුප්‍රාප්තිකයා වන ප්‍රාදේශීය ලේකම්වරයා එම ප්‍රාදේශීය සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා විශේෂ කොමසාරිස්වරයා වශයෙන් පත් කිරීමට ආදල අමාත්‍යවරයාට හැකිය.

වෙනයම් නීතියකට පටහැනි වීම හෝ අනුකූල නොවීම.

3. මෙම ප්‍රඥප්තියේ විධි විධාන සහ වෙනත් යම් නීතියක් අතර පටහැනි බවක් සහ අනුකූල නොවන බවක් තිබෙන විට, මෙම ප්‍රඥප්තියේ විධි විධාන එකී නීතියෙහි විධි විධාන අභිබවා සිටිනු ඇත.